# බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

ස්ථානය : බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව.

දිනය : 2009.01.24

වේලාව : පෙ.ව.11.00

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:-**

| | | | |
|---|---|---|---|
| 01. | ගරු සභාපති | - | ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා |
| 02. | ගරු නගර සභා මන්ත්‍රී | - | ධර්මසේන සමරසිංහ මැතිතුමා. |
| 03. | ගරු නගර සභා මන්ත්‍රී | - | ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 04. | ගරු නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඒ. වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා |
| 05. | ගරු නගර සභා මන්ත්‍රී | - | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 06. | ගරු නගර සභා මන්ත්‍රී | - | එම්.ටී.එම්. රූමි මැතිතුමා |
| 07. | ගරු නගර සභා මන්ත්‍රී | - | ඩබ්. විමලසේන මැතිතුමා |

**සහභාගීනොවූවෝ**:-

| | | | |
|---|---|---|---|
| 01. | ගරු උපසභාපති, | - | සුමේද චාමින්ද බස්නායක මැතිතුමා |
| 02. | ගරු නගර සභා මන්ත්‍රී | - | යූ.එච්. ගාමිණී මැතිතුමා |

**නිලධාරී සහභාගීත්වය:-**

| | | | |
|---|---|---|---|
| 01. | නාගරික ලේකම් | - | ආර්.ඩී. නලින් පුෂ්පකුමාර මහතා |

(01) **ආගම සිහිකිරීම**:

රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

(02) **ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන:**

ගරු සභාපතිතුමා කථා කරමින්, අද දින පැවැත්වෙන්නේ 2009 වර්ෂයේ පළමු සභා රැස්වීම බවත්, ඒ සඳහා සහභාගීවීමට පැමිණ සිටින, ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමා හා පුවත්පත්කලාවේදී මහතුන් සාදරයෙන් පිළිගන්නා බව ප්‍රථමයෙන් පැවසීය.

ඉන් අනතුරුව අදහස් දැක් වූ එතුමා, පූර්ව ළමාවිය සංවර්ධනය වැඩ සටහන යටතේ පෙර පාසල් නගා සිටුවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබාදීමට රජය විසින් කටයුතු කර තිබෙන බවත්, මෙම නගර සභාව ද වර්ෂ ගණනාවක සිට මෙම නගර සභා පෙර පාසල් පවත්වාගෙන යනු ලබන බවත්, මෙම පෙර පාසලෙහි සෑම වර්ෂයකම දරුවන් 70-80 ප්‍රමාණයක් අධ්‍යාපනය හදාරන බවත්, ඔවුන්ට නිසි අධ්‍යාපනයක් ලබාදී රටට වැඩදායී පුරවැසියක් ඇතිකිරීම අපගේ අරමුණ වන අතර, ඒ සඳහා මෙම නගර සභාව ද විශාල දායකත්වයක් ලබාදෙන බව දැන්වීය.

දරුවන්ගේ අධ්‍යාපනය මෙන්ම පෝෂණ තත්ත්වය ද නගා සිටුවිය යුතු බවත්, ඒ සම්බන්ධව දෙමාපිය දැනුවත් කිරීමේ රැස්වීමක් අද දින පැවැත්වීමට කටයුතු කල බවත් දැන්වීය. ලබන වර්ෂයේ සිට මෙම නගර සභා පෙර පාසලේ අධ්‍යාපනය ලබන දුවාදරුවන්ට නොමිළයේ නිළ ඇඳුම්, දිවා ආහාර හා වාර්ෂික විනෝද චාරිකාවක් ස!දහා අවශ්‍ය මුල්‍යාධාර අයවැය මගින් වෙන් කිරීමට තමා අදහස් කරගෙන සිටින බව දැන්වීය.

තව දුරටත් කථා කල ගරු සභාපතිතුමා, 2009 අයවැය ලේඛනයෙහි බස්නැවතුම්පල ණය වාරික ගෙවීම පෙන්නුම් කර තිබෙන නිසා අයවැයෙහි ඌණතාවක් දක්නට ලැබෙන බවත්, නමුත් මෙම වර්ෂයේ 100% වැටුප් ප්‍රතිපූර්ණය කරන බව ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් දන්වා තිබෙන නිසා, අපේක්ෂිත සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමට අවස්ථාව ලැබී ඇති බවත් දැන්වීය. නව ඉරිදා පොළ සකස් කිරීමේ කාර්යය මේ වනවිටත් ආරම්භ කර ඇති අතර, මෙම වර්ෂයේ මැයි මස එය ජනතා අයිතියට පැවරීමට තමා අදහස් කරගෙන සිටින බවත් දැන්වීය.

මෙම නගරයට අවශ්‍ය ක්‍රීඩාපිටියක්, පිහිනුම් තටාකයක්, හා කාය වර්ධන මධ්‍යස්ථානයක් ඉදිකිරීම ස!දහා අවශ්‍ය කටයුතු සම්පාදන කරන බවත් ස!දහන් කරන ලදී. මෙම නගර සභා බලප්‍රදේශ තුළ ගම නැගුම , මගනැගුම වැනි සංවර්ධන ව්‍යාපෘතීන් හරහා විශාල සංවර්ධනයන් කිරීමට හැකි වු බවත් . ඉදිරියේ දී පළාත් පාලන ආයතනය විසින් උපයාගනු ලබන බදු මුදල් උපයෝගී කරගෙන ස්වංව තම තමන්ගේ පළාත් පාලන ආයතන බල ප්‍රදේශ දියුණු කිරීමේ වගකීම පළාත් පාලන ආයතනය වලට පැවරෙන බවත් එම නිසා, ආදායම් උත්පාදනය කිරීමේ වැඩසටහන් ආරම්භ කිරීමට අපගේ විශේෂ අවධානය යොමුවිය යුතු බව දැන්වීය.

තවදුරටත් කථා කල ගරු සභාපතිතුමා, රුදුරු ත්‍රස්තවාදීන් පළවා හැර මේ රටේ එකීයභාවය ඇතිකිරීම ස!දහා විරෝධාර රණවිරුවන් ඉමහත් කැපවීමක් කරනු ලබන බැවින්, ඉතාමත් ඉක්මනින් මේ රටට සාමය ඇතිකිරීම ස!දහා ඔවුන්ට ශක්තිය හා ධෛර්ය ලැබේවා යි ප්‍රාර්ථනය කරන ලද අතර, ඉදිරියේ දී පැවැත්වීමට නියමිත වයඹ හා මධ්‍යම පළාත් සභා මැතිවරණයෙන් එක්සත් ජනතා සංධානයට විශිෂ්ඨ ජයක් ලැබේවා යි සුභාශිංසනය කරමින් සභාවේ ඉදිරි වැඩ කටයුතු කරගෙන යාමට ලේකම් මහතාට ආරාධනය කරන ලදී.

(03). **<u>2008.12.24 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කිරීම:</u>**

ගරු නගර සභා මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා කථා කරමින්, පසුගිය සභා වාර්තාවේ තීරණ අංක: 05:17 යටතේ මහජන පොළ ඉදිකිරීම කඩිනමින් 2009 ජනවාරි මස ආරම්භ කිරීම සුදුසු බවට සභාව ඒකමතිකව තීරණය කරන ලදී. යනුවෙන් සඳහන් කර ඇති බවත්, එය මහජන පොළ ඉදිකිරීම කඩිනමින් 2009 ජනවාරි මස ආරම්භ කිරීම සුදුසු බවට සභාව තීරණය කරන ලදී. යනුවෙන් සංශෝධනය කරන ලෙස ගරු නගර සභා මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් ඉල්ලා සිටි අතර, මෙම සභාව විසින් 2009 වර්ෂය සදහා සකස් කර ඇති අයවැය ඉතා සරලව. පහසුවෙන් කියවා ගැනීමට හැකිවන ආකාරයට සහ අලංකාරව සකස් කර ඇති බවත්, ඒ සම්බන්ධව සතුට පළකල අතර,ගරු සභාපතිතුමා, ලේකම්තුමා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයට තමාගේ ස්තුතිය පිරිනමන බවත් දැන්වීය. යන කොටස 1951 වර්ෂයේ සිට 2005 වර්ෂය මෙම නගර සභාවේ අයවැය ලේඛණය ඉංග්‍රීසි මාධ්‍යයෙන් සකස් කර තිබුණු බවත් , තමාගේ ඉල්ලීමකට අනුව 2005 වර්ෂයේ සිට එය සිංහල මාධ්‍යයෙන් සකස් කර ඇති බවත්, 2009 වර්ෂය සදහා ඉදිරිපත් කර ඇති අයවැය ඉතා සරලව. පහසුවෙන් කියවා ගැනීමට හැකිවන ආකාරයට සහ අලංකාරව සකස් කර ඇති බවත්, ඒ සම්බන්ධව සතුට පළකල අතර,ගරු සභාපතිතුමා, ලේකම්තුමා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයට තමාගේ ස්තුතිය පිරිනමන බවත් දැන්වීය යනුවෙන් සංශෝධනය කරන ලෙස ඉල්ලා සිටින ලදී. ඉහත සඳහන් සංශෝධනයන්ට යටත්ව 2008.12.24 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු නගර සභා මන්ත්‍රී එම්.ටී.එම්. රූමි මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් වාර්තාව සභා සම්මත විය.

(04) **පසුගිය වාර්තාව සමාලෝචනය කිරීම:**

වාර්තාව සමාලෝචනය කිරීමක් සිදුනොවීය.

05. **සභාවට ලැබී ඇති ලිපි/පෙත්සම්/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම:**

05:01 **බාන්ස්රත්වත්ත මාවත හා කොටුව පෙදෙස යා කෙරෙන මාර්ගය වැඩිදියුණු කිරීම පිළිබඳවයි**

උක්ත කරුණට අදාළව, බළන්ගොඩ, කොටුගොඩැල්ල පාර, කොටුව පෙදෙස, 4/11 ඒ දරණ ලිපිනයේ පදිංචි ගාමිණී අනුර වීරසේකර යන අය විසින් එවා ඇති 2009.01.02 දිනැති ලිපිය සභාගත කරන ලදී.
මෙම මාර්ගය පරිහරණය කරනු ලබන නගරවාසී සිය ගණනක ජනතාවගේ පහසුව උදෙසා අඩි 150 (මීටර් 30) පමණ දුර ප්‍රමාණයක් කොන්ක්‍රීට් අතුරා හෝ තාර දමා දෙන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

ගම නැගුම වැඩ සටහන යටතේ මෙම මාර්ගය සංවර්ධනය කිරීමට ඇතුළත් කරගෙන ඇති බැවි ඉල්ලුම්කරු වෙත දැනුම් දීමට සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

05:02 **බළන්ගොඩ මෙගොඩ කිරිදිගල මාර්ගය පටුවීම**

ඉහත ස!දහන් කාරණය සම්බන්ධව පළාත් පාලන කොමසාරිස් විසින් එවා ඇති 2009.01.07 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

බළන්ගොඩ, ඕළුගන්තොට, පතිරණ නිවස යන ලිපිනයෙහි පදිංචි ඩබ්.ටී. සුමනාවතී මිය විසින් අතිගරු ජනාධිපතිතුමා වෙත යොමු කර ඇති 2007.06.21 දිනැති ලිපියෙහි ස!දහන් කරුණු සම්බන්ධව පරීක්ෂා කිරීමේ දී අනාවරණය වු කරුණු අනුව, ප්‍රමාණවත් පවුල් සංඛ්‍යාවක් භාවිතා කරන ඉහත මාර්ගය පුළුල් කිරීම සඳහා අදාල ඉඩම් හඳුනා ගැනීමක් කර ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ විධි විධාන පරිදි එම ඉඩම් පවරා ගැනීමට අදාල මූලික කටයුතු කර මාර්ගය සංවර්ධනය කරන ලෙස එමගින් දන්වා තිබෙන බව ලේකම් මහතා සභාව වෙත පැහැදිලි කරන ලදී.

ඉඩම් කොටස අත්පත් කරගැනීමට කටයුතු කරන ලෙස ප්‍රාදේශීය ලේකම් බලන්ගොඩ වෙතින් ඉල්ලීමක් කිරීමටත්,ඒ සඳහා වැයවන මුදල් සභා අරමුදලින් දැරීමටත් තීරණය කරන ලදී.

05:03 **බාන්ස්රත්වත්ත මාවතේ වාහන නැවැත්වීමේ අවහිරතා ඉවත් කරදෙන ලෙස ඉල්ලීම.**

උක්ත කරුණට අදාළව, බළන්ගොඩ පොලිස් ස්ථානාධිපති අමතමින්, මෙම සභාවේ ගරු සභාපතිතුමාට ද පිටපත් සහිතව ප්‍රාදේශීය ලේකම්, බලන්ගොඩ විසින් එවා ඇති 2009.01.07 දිනැති ලිපිය සභාගත කරන ලදී.

දිනපතා විශාල වාහන සංඛ්‍යාවක් වාහන බලපත්‍ර ලබාගැනීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණෙන බැවින් කාර්යාල භූමියේ වාහන නවතා තැබීම ආරක්ෂා සහිත නොවන බැවින් මහා මාර්ගයේ එක් පසෙක පමණක් නැවැත්වීමට පියවර ගැනීම සුදුසු බවත්, ඒ හැර මෙම දිනවල විශාල වශයෙන් පාසල් සිසුන් හා මහජනයා කාර්යාල භූමියේ ගැවසෙන බැවින් එම අයවළුන්ගේ ආරක්ෂාව පිළිබඳව අවධානය යොමුකළ යුතු බැවින් ද, වාහන පරීක්ෂා කර ඇතුළු කිරීමේ පහසුකම් ද නොමැති බැවින් ද වාහන කාර්යාල භූමියට ඇතුල් කිරීමට ඉඩදිය නොහැකි බව එමගින් අවධාරණය කර ඇති බව ලේකම් මහතා සභාව වෙත පැහැදිලි කරන ලදී.

නගර සභාව අසල සිට පෙට්ටිගල පාර වම්පස මාර්ගයෙහි වාහන නවතා තැබීම තහනම් කිරීම සුදුසු බවට තීරණය කල සභාව ඒ පිළිබඳව ගැසට් නිවේදනයක් නිකුත් කරන ලෙස මාර්ග සංවර්ධන අධිකාරියෙන් ඉල්ලීමක් කිරීමට තීරණය කරන ලදී.

05:04 **ජලනල පහසුකම් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබාගැනීම**

බළන්ගොඩ, වැලිහරනාව, ගම්මානයට ජලය ලබාදෙන ලෙස ගම්වාසීන් විසින් 2009.01.15 වන දින කරන ලද ඉල්ලීමකට ගරු සභාපතිතුමා ක්ෂණික අවධානය යොමු කර එම අවශ්‍යතාව ඉටුකිරීමට කටයුතු කරන ලද අතර, එහි ඉතිරි වැඩ කටයුතු ඉටුකරගැනීම සඳහා අවශ්‍ය නල පද්ධතිය සභාව මගින් ලබාදෙන ලෙස ඉල්ලමින්, එම ගම්වාසීන් විසින් ඉදිරිපත්කර ඇති ලිපියක් සභාගත කරන ලදී. මෙම කර්මාන්තයේ ඉතිරි වැඩ කොටස් ඉටුකරගැනීම සඳහා සභා අරමුදලින් රු.50,000/- ක මුදලක් ලබාදීම සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු සභාපතිතුමා විසින් ස්ථිර කරන ලදී. මේ සඳහා ඇස්තමේන්තුවක් සකස් කරන ලෙස වැඩ අධිකාරී මහතා වෙත දැනුම් දීමට සභාව තීරණය කරන ලදී.

05:05 **බළන්ගොඩ නගරයේ ප්‍රධාන මාර්ගයන් දෙපස ආරක්ෂිත වැටෙහි දැන්වීම් පුවරු සවිකිරීම.**

බලගහමුල හා දොරවෙල නව මාර්ගයේ ආරක්ෂිත වැටෙහි නගර සභාවේ අනුමැතිය සහිතව 2 ෘ 3 ප්‍රමාණයේ ඩේවිඩ් පීරිස් මෝටර් සමාගමේ බෝඩ් 40 ක් සවිකරන ලද බවත්, ඒ සඳහා රු.20,700/- ක මුදලක් ප්‍රදර්ශන බලපත්‍ර ගාස්තු වශයෙන් අයකරන ලද අතර, මේ සඳහා මාර්ග සංවර්ධන අධිකාරියෙන් ද අවසර ලබාගන්නා ලෙස දැන් වූ අතර, ඒ සඳහා රු.268,800/- ක මුදලක් ගෙවන ලෙස නියම කර ඇති බවත්, එම මුදල ගෙවීමට නොහැකි නිසා සියළුම බෝඩ් ඉවත් කරගත් බැවින්, නගර සභාවට ගෙවූ මුදල ආපසු ලබාදෙන ලෙස ඉල්ලීමක් කර ඇති බවත්, ආදායම් අංශයෙන් වාර්තා කර තිබිණ.

මෙම මුදල ආදායමට බැර වී ඇති බැවින්, මුදල් ගෙවීමට නොහැකි බවත්, එම සමාගමේ වෙනත් ප්‍රචාරක පුවරු තිබේ නම් එවා නගර සභා බලප්‍රදේශය තුළ සවි කිරීමට අනුමැතිය ලබාදීමටත් තීරණය කරන ලදී. මහජනතාව අසාධාරණයකට ලක්වන ආකාරයට මුදල් අයකිරීම පිළිබඳව, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම වෙත කරුණු ඉදිරිපත් කිරීමටත්, මෙම කාරණය පිළිබඳව මෙම සභාව සමග සාකච්ඡා කරන ලෙස මාර්ගය සංවර්ධන අධිකාරිය වෙත දැනුම් දීමටත් තීරණය කරන ලදී.

05:06 **අංක:232 කල්තොට පාර,බළන්ගොඩ ඉඩමෙහි වරිපනම් බදු සම්බන්ධව**

බළන්ගොඩ කල්තොට පාර අංක: 32 දරණ ලිපිනයේ පදිංචි ආර්.ඒ. නානායක්කාර මහතා විසින් එවා ඇති උක්ත කරුණට අදාළ 2008.12.15 දිනැති ලිපිය සභාගත කරන ලදී.

ඉහත සඳහන් ඉඩමෙහි වරිපනම් බදු වශයෙන් රු.12000/- ක මුදලක් ගෙවීමට තමා වෙත දැනුම් දී ඇති බවත්, මෙතෙක් කිසිදු දිනක ඉහත සඳහන් ස්ථානයට වරිපනම් ගෙවන ලෙස තමා වෙත දන්වා නොමැති බවත්, මෙම ඉඩම ධර්මරත්න බස්නායක මහතා විසින් තමා වෙත පවරා දුන් අතර, ඔහුගේ නමින් ද මේ වෙනතෙක් වරිපනම් බදු ගෙවා නොමැති බව සඳහන් කර සිටින බැවින්, පසුගිය කාල සීමාව සඳහා අමතර මුදලක් අයකිරීම අසාධාරණ බැවින්. නියමිත මුදල පමණක් සඳහන් කර අදාල බදු නිවේදනය තමා වෙත ලැබීමට සලස්වන ලෙස එමගින් ඉල්ලා ඇති බව ලේකම් මහතා සභාව වෙත පැහැදිලි කරන ලදී.

වරිපනම් බදු මුදලෙහි සංශෝධනයක් කල නොහැකි බවත්, අදාළ මුදල ගෙවන ලෙස දැනුම් දීමටත් සභාව තීරණය කරන ලදී.

05:07 **පොදු වෙළඳසල කඩ කාමර වල කුලිය අඩුකිරීම:**

බළන්ගොඩ පොදු වෙළඳසලෙහි කුඩා කඩ කාමර 04 ඇති අතර, මෙම කඩ කාමර වල කිසිදු වෙළඳාමක් සිදුකල නොහැකි බවත්, මේ වන විට එළවළු කුණු දමා අපවිත්‍ර කර ඇති බවත්, මෙම කඩ කාමර 4 න් 2 ක් දෙදෙනෙකු විසින් තමන්ගේ වෙළඳ භාණ්ඩ පමණක් තබා ගැනීම සඳහා යොදාගෙන ඇති අතර, ඒ සඳහා පසුගිය වර්ෂ වල මසකට රු.1000/- ක මුදලක් අයකල බවත්, මෙම වර්ෂය සඳහා කඩකුලී වැඩිකිරීමේ දී මෙම කඩ කාමර සඳහා රු.1000/- කුලී මුදලක් අයකිරීමට තීරණය කර ඇති බවත්, මෙවැනි මුදලක් ගෙවීම අපහසු බව එම කඩ කාමර පරිහරණය කරනු ලබන අය විසින් දන්වා තිබෙන බව විෂය භාර නිලධාරී විසින් වාර්තා කර තිබුණි.

අදාල මුදල ගෙවන ලෙසත්, එම මුදල ගෙවීමට නොහැකි නම්, එම කඩ කාමර සභාව වෙත පවරා ගැනීම සුදුසු බවටත් තීරණය කරන ලදී.

05:08 **කරවිකැටිය ජල ටැංකිය පාර**

උක්ත කරුණට අදාළව බලන්ගොඩ අංක:82/4 බාන්ස්රත්වත්ත මාවත යන ලිපිනයේ පදිංචි ඒ.ඩී. ආරියදාස මහතා විසින් එවා ඇති 2009.01.22 දිනැති ලිපිය සභාගත කරන ලදී.

කරවිකැටිය ජල ටැංකිය පාර ශුද්ධ කිරීමේ කටයුතු පසුගිය දිනවල සිදුකර ඇති අතර, මෙම මාර්ගය අවසාන කොටස (ජාලියදාස මහතාගේ නිවස අසලින් උඩකන්ද පාරට සම්බන්ධවන කාර්මික නිලධාරී බණ්ඩාර මහතාගේ නිවස ඉදිරිපිටින් දිවෙන පාරට සම්බන්ධ කොටස) ශුද්ධ කර නොමැති නිසා මෙහි ගමන් කරන පාසල් දරුවන් හා මහජනතාව අපහසුතාවකට ලක්ව ඇති බැවින්, එම කොටස ශුද්ධ කර දෙන ලෙස එමගින් ඉල්ලා ඇති බව ලේකම් මහතා සභාව වෙත දන්වන ලදුව, මෙම මාර්ගය පිළිබඳව වාර්තාවක් සපයන ලෙස වැඩ අධිකාරී මහතා වෙත දැනුම් දීමට සභාව තීරණය කරන ලදී.

05:09 **පදික වේදිකා අත් වැට වෙළඳ ප්‍රචාරණය සඳහා ලබාගැනීම.**

බළන්ගොඩ නගරයේ අළුතින් ඉදිකොට ඇති පදික වේදිකා වල අත්වැටවල් තීන්ත ආලේප කර වර්ණ ගැන්වීම සිදුකිරීම සඳහා වෙළඳ ප්‍රචාරණ ආයතනයක අනුග්‍රහයක් ලබාගැනීමට බලාපොරොත්තු වන අතර, ඒ සඳහා අවසර ලබාදෙන ලෙස ඉල්ලමින් බලන්ගොඩ බස්නැවතුම්පල පාර අංක: 25/26 සී මාස්ටර් මීඩියා හි කළමනාකරු විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මේ සඳහා සභාවේ අනුමැතිය ලැබුණු අතර, මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබාගැනීමට තීරණය කරන ලදී.

05:10 **2010 වර්ෂය සඳහා 1% කින් වරිපනම් බදු වැඩිකිරීම**

ඉහත සඳහන් කාරණයට අදාළව ආදායම් අංශයෙන් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

2009 වර්ෂය සඳහා දැනට වරිපනම් බදු ගෘහස්ථ ස්ථාන සඳහා 4% ක් ද, ව්‍යාපාරික ස්ථාන සඳහා 5% ක් ද, වශයෙන් අයකරනු ලබන ලබන අතර, 2007/2008 හා 2009 වර්ෂ සඳහා වරිපනම් බදු වැඩිවීමක් සිදුනොකල බැවින්, 2010 වර්ෂයට වරිපනම් බදු 1%කින් වැඩිකිරීම පිළිබඳව සලකා බලා තීරණයක් ගැනීම සුදුසු බව එමගින් වාර්තා කර තිබිණ.

පළාත් පාලන ගරු අමාත්‍යතුමාගේ අනුමැතියට යටත්ව, 2010 වර්ෂය සඳහා 1% කින් වරිපනම් බදු වැඩිකිරීමට තීරණය කල සභාව, නගර සභා බලප්‍රදේශයට අයත් ප්‍රදේශ සියල්ලෙහිම පවතින දේපල තක්සේරු කරවා ගැනීම සුදුසු බවට ද තීරණය කරන ලදී.

05:11 **පිළිසරු ජාතික ඝන අපද්‍රව්‍ය වැඩසටහන යටතේ පළාත් පාලන ආයතන වලට කොම්පෝස්ට් බඳුන් ලබාදීම.**

උක්ත කරුණට අදාළව මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් එවා ඇති 2009.01.02 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

මධ්‍යම පරිසර අධිකාරියේ ජාතික පිළිසරු ව්‍යාපෘතිය මගින් කොම්පෝස්ට් බඳුන් නිෂ්පාදනය කරනු ලබන ආයතන වලින් කොම්පෝස්ට් බඳුන් මිළදී ගන්නා අතර, එම කොම්පෝස්ට් බඳුන් වල මිලෙන් 50% ක් පිළිසරු ව්‍යාපෘතිය ද, ඉතිරි 50% අදාළ පළාත් පාලන ආයතනය සහ එම බඳුන් ලබාගන්නා පුද්ගලයා විසින් දැරිය යුතු වන බවත්, පළාත් පාලන ආයතනය දරනු ලබන 50% ක වියදමින් අඩක් අදාළ කොම්පෝස්ට් බඳුන ලබාගන්නා පුද්ගලයාගෙන් අයකර ගැනීමේ ක්‍රමවේදයක් පළාත් පාලන ආයතනයට ක්‍රියාත්මක කළ හැකි බවත් ඒ අනුව, එක් ප්ලාස්ටික් කොම්පෝස්ට් බඳුනක් වැට් බදු ඇතුළත්ව රු.2099/- ක් වන අතර, ඒ අනුව එක් කොම්පෝස්ට් බඳුනක් සඳහා රු.1049.50 ක මුදලක් ගෙවිය යුතු වන අතර, එම බඳුන් අදාළ පළාත් පාලන ආයතනයට ප්‍රවාහනය කරදීම පිළිසරු ව්‍යාපෘතිය මගින් සිදුකරනු ලබන අතර, එම බඳුන් භාවිතා කරන ආකාරය පිළිබඳව ක්‍රමවත් පසුවිපරම් සැලසුමක් මෙම ව්‍යාපෘතිය මගින් සකසන අතර, එම පසුවිපරම් කටයුතු ක්‍රමවත්ව සිසුකිරීමට අදාළ පළාත් පාලන ආයතනය එකඟ විය යුතු වන අතර, එම කරුණු වලට එකඟව, අත්‍යවශ්‍යම කොම්පෝස්ට් බඳුන් සංඛ්‍යාව කොපමණ ද යන්න දන්වා එවන ලෙස එමගින් ඉල්ලා තිබිණි.

කොම්පෝස්ට් බඳුන් 100 ක් මිළදී ගැනීමට සභාව තීරණය කරන ලදී.

05:12 **ස්තුතිය පළකිරීම**

ගැමුණු හේවා රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙත ගාස්තු අයකිරීමකින් තොරව 2009.01.10 වන දින මෙම නගර සභාවේ ගලී බවුසරයේ සේවය ලබාදෙමින් දැක් වූ සහයෝගයට කෘතවේදී ස්තුතිය ප්‍රකාශ කරන බව දන්වමින්, කුරුවිට යුද හමුදා කඳවුරෙහි සේනාවිධායක වෙනුවට, කර්නල්, ජේඑම්ඩීඑන්සී ජයමග මහතා විසින් එවා ලිපියක් ගරු සභාවේ දැනගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

සුභසාධන සේවාවක් වෙනුවෙන් කරන සේවාවක් සේ සලකා මුදල් අයකරගැනීමකින් තොරව මෙය ඉටුකිරීම මේ සඳහා අනුමැතිය ලබාදෙන ලදී.

05:13 **වකුගඩු සැත්කම සඳහා ආධාර ලබාගැනීම**

ඉහත සඳහන් කාරණයට අදාළව, ගරු සබරගමුව පළාත් සභා මන්ත්‍රී රම්‍ය කුමාර වීරසිංහ මැතිතුමා විසින් එවා ඇති 2008.12.01 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මඩාර, නිවිතිගල ලිපිනයේ පදිංචි කේ.ඊ. නෙල්සන් කපිල වීරසේන මහතා දරුණු ලෙස වකුගඩු රෝගයකින් පීඩා විඳින අතර, ඔහුගේ වකුගඩු දෙකම අක්‍රීයව පවතින අතර, සතියකට වරක් යන්ත්‍රයක් මගින් ලේ පිරිසිදු කල යුතුව ඇති බවත්, ඒ සඳහා මසකට 33,600/- ක පමණ මුදලක් වැය වන අතර, මොහුට වකුගඩුවක් බද්ධ කිරීම සඳහා රු.300,000/- ක පමණ මුදලක් වැයවන බව ජයවර්ධනපුර රෝහලේ විශේෂඥ වෛද්‍ය සී.ඒ. හේරත් මහතා විසින් දන්වා ඇති බවත්, මෙම මහතා අසරණ පවුලක තරුණයකු වන අතර, සැත්කම සඳහා මෙතරම් මුදලක් වැයකිරීමට මොහුට ශක්තියක් නොමැති බැවින්, ඒ සඳහා හැකි පමණින් උපකාරයක් බලාපොරොත්තු වන බව දන්වා තිබිණ.

ඉහත සඳහන් අය වකුගඩු රෝගයකින් පෙළෙන බවට වෛද්‍ය වාර්තා, ගිණුම් අංකය හා එම අයගේ ඉල්ලීම් ලිපියක් මෙම සභාව වෙත යොමු කරවන ලෙස ඉල්ලීම ඉදිරිපත් කල ගරු මන්ත්‍රීතුමා වෙත දැණුම් දීමට සභාව තීරණය කරන ලදී.

## 05:14 විදේශ පුහුණු වැඩ සටහන - 2008

ඉහත කරුණ සම්බන්ධයෙන් පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ අධ්‍යක්ෂ විසින් තමා වෙත එවන ලද ඔහුගේ අංක:සීඑල්අයිජී හා 2008.09.24 දිනැති ලිපිය අනුව විදේශ පුහුණු වැඩසටහන සඳහා කැමැත්ත දක්වන නිලධාරීන්ගේ අයදුම්පත් 2008.10.01 වන දින හෝ ඊට පෙර තමා වෙත එවීමට කටයුතු කරන ලෙස ඉල්ලමින් පළාත් පාලන කොමසාරිස් විසින් එවා ඇති 2008.10.08 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මේ සම්බන්ධව සලකා බැලූ සභාව, මෙම සභාවේ ගරු සභාපතිතුමා හා වැඩ අධිකාරී යූ.වී. දැල බණ්ඩාර මහතාගේ අයදුම්පත් උක්ත පුහුණු වැඩ සටහන සඳහා යොමුකිරීම සුදුසු බවටත්, මේ සඳහා වැය වන සියළු වියදම් සභා අරමුදලින් දැරීමටත්,මේ සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගැනීමටත් තීරණය කරන ලදී.

## 05:15 'වවරුජස්එසදබ ඇඑසකසබට 'බා ඇරදසමටයඑසබට පදර අ.. එැබ .. ඡ පාඨමාලාව සඳහා අයදුම්කිරීම

නිවාස සැලසුම් හා ගොඩනැගිලි මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන උක්ත පාඨමාලාව සඳහා කාර්මික නිලධාරී එම්.කේ.ජේ. නිශ්ශංක මහතා විසින් ඉල්ලුම් කර ඇති බවත්, පාඨමාලා ගාස්තුව සඳහා රු.12,500/- ක මුදලක් වන අතර, අදාල මුදල ගෙවා මෙම නිලධාරී මහතා එම පුහුණු පාඨමාලාව සඳහා සහභාගීකරවීමට සභාවේ අනුමැතිය පතමින් විෂය භාර නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

සභා අරමුදලින් පාඨමාලා ගාස්තු ගෙවා මෙම නිලධාරී මහතා ඉහත සඳහන් පුහුණු පාඨමාලාව සඳහා සහභාගීකරවීම සුදුසු බවටත්, මේ සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගැනීමටත් තීරණය කරන ලදී.

## 05:16 පළාත් පාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

ඉහත ස!දහන් කරුණට අදාළව පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ අධ්‍යක්ෂ නිමල් කේ බණ්ඩාර මහතා විසින් එවා ඇති 2009.01.05 දිනැති ලිපිය සභාගත කරන ලදී.

පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමාගේ උපදෙස් පරිදි එම අමාත්‍යාංශයේ මගපෙන්වීම යටතේ එම ආයතනය විසින් ඉහත සඳහන් ඩිප්ලෝමා පාඨමාලාවේ දෙවෙනි කණ්ඩායම පුහුණු කිරීමට සැලසුම්කොට ඇති අතර, මෙම ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා මෙම නගර සභාවේ ලේකම් ආර්.ඩී. නලින් පුෂ්පකුමාර මහතා තෝරාගෙන ඇති බැව් දන්වා ඇත.

පාඨමාලාව සඳහා සහභාගීවන එක් අයෙකු වෙනුවෙන් රු.40,000/- ක සහනදායී පාඨමාලා ගාස්තුවක් අයකිරීමට තීරණය කර ඇති අතර, එයින් රු.30,000/- ක් අදාළ පළාත් පාලන ආයතනයෙන් ගෙවිය යුතු වන අතර, ඉතිරි රු.10,000/- ක මුදල පාඨමාලාවට සහභාගී වන අය විසින් සිය පෞද්ගලික මුදලින් ගෙවිය යුතු වන අතර, පළාත් පාලන ආයතනය කැමති නම් එක් අයෙකු වෙනුවෙන් දැරිය යුතු මුළු මුදල වන රු. 40,000/- එක් එක් අපේක්ෂකයා වෙනුවෙන් ගෙවිය හැකි බව සඳහන් කර තිබිණ

පාඨමාලාව සඳහා වැයවන රු.40,000/- ක මුදල ගෙවා මෙම පාඨමාලාව සඳහා මෙම සභාවේ ලේකම් ආර්.ඩී. නලින් පුෂ්පකුමාර මහතා සහභාගී කරවීම සුදුසු බවටත්, මේ සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගැනීමටත් තීරණය කරන ලදී.

05:17 **දෛනික පදනම මත සේවය කිරීම සඳහා අනුමැතිය ඉල්ලීම**
**ජේ.සී.බී.යන්ත්‍ර ක්‍රියාකරු**

ජේ.සී.බී. යන්ත්‍ර ක්‍රියාකරු කේ.ඩී. මංජුල ප්‍රසන්න මහතා විසින් ඉහත සඳහන් කරුණට අදාළව ඉදිරිපත් කර ඇති 2009.01.28 දිනැති ලිපිය සභාගත කරන ලදී.

තමා මෙම නගර සභාවේ ජේ.සී.බී. යන්ත්‍ර ක්‍රියාකරු වශයෙන් කොන්ත්‍රාත් පදනම මත සේවය කරන බවත්, එසේ සේවය කිරීමේ දී ජේ.සී.බී. යන්ත්‍රයේ සේවා අවශ්‍යතා සඳහා තමා නිරතුරුවම සේවා අපේක්ෂාවෙන් රැඳී සිටිය යුතුව ඇති බවත්, එහෙත් බොහෝ අවස්ථාවන්හි දී එසේ රැඳී සිටියදී නියමිත රාජකාරී කටයුත්තක් නොවූ බැවින්, කිසිදු රාජකාරියක් නොකර ආපසු යෑමට සිදු වූ වාර ගණනාවක්ම තිබුණු අතර, මෙම හේතුව නිසා බොහෝ මාසවල තමාගේ වැටුප රු.5000/- කට ද වඩා අඩු වූ අතර, එක් දරු පියෙක් වශයෙන් ජීවත්වීම සඳහා එම මුදල කෙසේවත් ප්‍රමාණවත් නොවන බව දන්වමින්, එම අය දෛනික වැටුපෙහි පිහිටුවන ලෙස එමගින් ඉල්ලා ඇති බව ලේකම් මහතා සභාව වෙත දන්වන ලදී.

මේ සම්බන්ධව සලකා බැලූ සභාව, මෙම සේවක මහතා දෛනික වැටුප් පදනම මත සේවයට බඳවා ගැනීමට තීරණය කරන ලදී.

05:18 **කුඩා ළමුන් සඳහා ඉංග්‍රීසි භාෂා පංති පැවැත්වීම**

බළන්ගොඩ, කරවිකැටිය අංක:32/2 දරණ ලිපිනයේ පදිංචි තිළිණි රත්මුතුගේ යන අය කුඩා ළමුන් සඳහා ඉංග්‍රීසි පංති පවත්වන බවත්, එම පංති පැවැත්වීම සඳහා නගර සභා පෙර පාසල් ගොඩනැගිල්ල ලබාදෙන ලෙස ඉල්ලීමක් කර ඇති බව ලේකම් මහතා සභාව වෙත දන්වන ලදුව, ඒ සඳහා සභාවේ අවසරය ලබාදෙන ලදී.

05:19 **හිඟ වරිපනම් බදු අයකිරීම**

බළන්ගොඩ නගර සභා බලප්‍රදේශයේ හිඟ වරිපනම් බදු එකතු කිරීමේ කාර්යය එම්.ජී. මිලින්ද මනෝජ් ගුණරත්න යන අයට පැවරීම සඳහා සකස් කල පත්වීම් ලිපියක් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණි.

එකතු කරනු ලබන මුදලින් 10% ක කොමිස් මුදලක් ගෙවීමේ කොන්දේසියට යටත්ව මේ සඳහා සභාවේ අවසරය ලබාදීමට තීරණය කරන ලදී.

05:20 **ලිපිගොනු අල්මාරි ලබාගැනීම හා කාර්යාල මේස, පුටු , මිළදී ගැනීම**

කර්මාන්ත අංශයේ ලිපිගොනු සුරක්ෂිතව තැබීම සඳහා අගුල් දැමිය හැකි වානේ කබඩ් 03 ක් ලබාදෙන ලෙස ඉල්ලා වැඩ අධිකාරී මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මේ පිළිබඳව සලකා බැලූ සභාව, වානේ අල්මාරි 03 ක්, විධායක මේස 02 ක් , හා විධායක පුටු 02 ක් මිළ ගණන් කැඳවා මිළදී ගැනීමට තීරණය කරන ලදී.

05:21 **ඉන්ධන සීමාවක් පැනවීම**

මෙම සභාවේ ගරු සභාපතිතුමා විසින් පාවිච්චි කරනු ලබන නිල වාහනය සඳහා ඉන්ධන සීමාවක් පනවා ගත යුතු බව විගණන අධිකාරී මහතා විසින් දන්වා ඇති බව සඳහන් කරමින් විෂය භාර නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදුව, ලීටර් 500 ක ඉන්ධන සීමාවක් පැනවීමට සභාව තීරණය කරන ලදී.

05:22 **ගාස්තු සංශෝධනය කිරීමට සහා අනුමැතිය ලබාගැනීම**

වර්තමානයේ වෙළඳපලේ ඉන්ධන මිල අඩු වී ඇති බැවින්, ජේ.සී.බී යන්ත්‍රය කුළියට ලබාදීමේ ගාස්තු පහත දැක්වෙන ආකාරයට සංශෝධනය කිරීම සුදුසු බවත්, මෙම යන්ත්‍රය මුදල් අයනොකර කිසිම ආයතනයකට හෝ පුද්ගලයෙකුට ලබානොදෙන ලෙස විගණන නිලධාරීන් විසින් උපදෙස් ලබාදුන් බව දන්වමින් විෂය භාර නිලධාරී විසින් ඉදිරිපත්කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

| | පැරණි ගාස්තුව | සංශෝධිත ගාස්තුව |
|---|---|---|
| ජේ.සී.බි.යන්ත්‍රය පැය 01 ක් කුළියට ලබාදීම | 2500/- | 2000/- |
| වැට් | 375/- | 240/- |

මේ පිළිබඳව සාකච්ජා කල සභාව, සංශෝධිත නව ගාස්තු අයකිරීම සුදුසු බවට තීරණය කරන ලදී.

23. **සභාපති හා නාගරික මන්ත්‍රීවරුන්ගේ අරමුදල**

උක්ත අරමුදල ස!දහා පහත සදහන් පරිදි මුදල් ලැබී ඇති ස!දහන් කරමින් ප්‍රධාන කළමනාකරණ සහකාර නිලධාරිණිය විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් ගරු සභාවේ දැනගැනීම සදහා සභාගත කරන ලදී.

| | මුදල |
|---|---|
| 1. නියාඩ් හාජ්ජියාර් ජයරත්න | රු. 1000.00 |
| 2. ජගත් නිහාල් ජයරත්න | රු. 13050.00 |
| 3. රුවන් භාග්‍ය ප්‍රියන්ත | රු. 6000.00 |
| 4. ඩබ්.ටී. නයනසේකර | රු. 7500.00 |
| 5. රෝහිත පෙරේරා | රු. 50000.00 |
| 6. ඩබ්.ඒ. අජිත් විජයරත්න | රු. 7500.00 |
| 7. ඔක්ස්ෆර්ඩ් ඉන්ටනැෂනල් | රු. 7500.00 |
| 8. එම්. අමරසේන | රු. 6000.00 |
| 9. සුරි!දු ලොරි රථ සංගමය | රු. 7500.00 |
| 10. මොබිටෙල් ප්‍රයිවට් ලිමිටඞ් | රු. 500.00 |
| මු!ළු මුදල | රු.106550.00 |

මෙම මුදලින් පහත සදහන් පරිදි ගෙවීම් කර ඇත.

| | |
|---|---|
| 1. රේණුකා ප්‍රියදර්ශනී (විශ්ව විද්‍යාල අධ්‍යාපනය ස!දහා) | රු.5000.00 |
| 2. ර/ශාන්ත ඇග්නස් බාලිකා ම.වි ( වැසිකිළි පද්ධතිය අ.වැ.) | රු.5000.00 |
| 3. ඊ.ජී. චන්ද්‍රලතා ( ර/විද්‍යාලෝක මහ විදුහලේ පැවැති රුධිර පුජා වැඩ සටහන ) | රු.5000.00 |
| 4. පෙර පාසැල් පාලිකා ( වැවේවත්ත පෙර පාසල ) | රු. 2000.00 |
| | රු.17000.00 |

ඉහත අංක 05 යටතේ ලැබී ඇති රු. 50,000/- ක මුදල දැන්වීම් පුවරු සකස් කිරීමට පැමිණි සේවකයින් වෙත සභාපතිතුමා විසින් ලබා දී ඇති බවත්, මෙම මුදල මෙතෙක් බැංකු ගත කර නොමැති බවත් සඳහන් කර තිබුණි.

05.25. **<u>බලන්ගොඩ නගර සභාවේ පී.කේ.1483 දරණ ජෝන්ඩියර් ට්‍රැක්ටරය සම්පූර්ණ අළුත්වැඩියාවක් කිරීම</u>**

මෙම නගර සභාව සතු පී.කේ.1483 දරණ ජොන්ඩියර් ට්‍රැක්ටරයේ පහත සඳහන් අළුත්වැඩියාවන් කළ යුතුව ඇති අතර, මෙම ට්‍රැක්ටරය පරික්ෂා කර බලා සම්පූර්ණ අළුත්වැඩියාවක් කිරීම පිණිස දේව් ට්‍රැක්ටර් සමාගමෙන් ඇස්තමේන්තුවක් ලබාගැනීම සුදුසු බව විෂය භාර නිලධාරිණිය විසින් සභාව වෙත වාර්තා තිබුණි.

1. ඇන්ජිම අළුත්වැඩියා කිරීම
2. ගියර් පෙට්ටිය අළුත්වැඩියා කිරීම
3. ක්ලච් ප්ලේට් අළුත්වැඩියා කිරීම
4. රේඩියේටරය අළුත්වැඩියා කිරීම
5. ලයිට් පද්ධතිය අළුත්වැඩියා කිරීම (හෝර්න් එක සමගින් )
6. පවර් ස්ටියරින් හෝස් එකක් අළුත්වැඩියා කිරීම
7. වෝල්ටිනේටරය අළුත්වැඩියා කිරීම

මෙම ට්‍රැක්ටර් රථය අළුත්වැඩියාව සඳහා සභාවේ ආවරණය අනුමැතිය ලැබුණු අතර, අළුත්වැඩියාව සඳහා ඇස්තමේන්තුවක් ලබාගැනීමට ද තීරණය කරන ලදී.

05.26. **<u>කොන්ත්‍රාත් පදනම මත පුස්තකාල සහයිකා තනතුර සඳහා බඳවා ගැනීම</u>**

බලන්ගොඩ නගර සභා මහජන පුස්තකාලයට කොන්ත්‍රාත් පදනම මත පුස්තකාල සහයිකා තනතුර සඳහා අයදුම්පත් කැඳ වු අතර, අයදුම්පත් දෙකක් ඉදිරිපත් වී තිබෙන බව විෂය භාර නිලධාරිණිය විසින් සභාවට වාර්තා කර තිබුණි.

මෙම ඉල්ලුම්පත් දෙක අතරින්, මෙම නගර සභාවේ යතුරු ලියන කටයුතු සඳහා කැලී ගෙවීමේ පදනම මත සේවයට බඳවා ගෙන ඇති ඉන්දුකා ප්‍රියානි යන අයගේ අයදුම්පත්‍රය පිළිබඳ සලකා බැලූ සභාව, ඇය වසර 12 ක පමණ කාලයක් මෙම නගර සභාවේ සේවය කර ඇති නිසාත්, අදාල සුදුසුකම් සපුරා ඇති බැවිනුත්, මෙම තනතුර සඳහා බඳවා ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

05:26 **<u>ආයුර්වේද බෙහෙත් ශාලාව සඳහා ඖෂධ ලබාගැනීම</u>**

මෙම නගර සභාවේ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව සඳහා ඖෂධ ලබාදෙන ලෙස ආයුර්වේද වෛද්‍ය නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදුව, නාවින්න ආයුර්වේද ඖෂධ සංස්ථාව වෙතින් රු.150,000/- වටිනාකමට සරිලන සේ සභා අරමුදලින් ඖෂධ ලබාගැනීමට තීරණය කරන ලදී.

05:27 **<u>දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශණය - 2009</u>**

උක්ත ප්‍රදර්ශණය සඳහා මෙම නගර සභාවේ කොම්පෝස්ට් ව්‍යාපෘතිය අදාළ කරගෙන නව ප්‍රදර්ශන කුටියක් දර්ශණීය ආකාරයට සකස් කිරීමට පියවර ගන්නා ලෙසත්, ඒ සඳහා වැය වන ප්‍රතිපාදන තම වාර්ෂික ඇස්තමේන්තු තුල යොදවා ගන්නා ලෙස දන්වමින්, සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම් විසින් එවා ඇති 2009.01.26 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

මෙම අවස්ථාවේ දී ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා කථා කරමින්, පසුගිය වර්ෂයේ දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කළ ආකෘතියම නැවත වරක් අළුත්වැඩියා කර මෙවර ද ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දැනගැනීමට ඇති බවත්, මේ ස!දහා 3,800,00/-.ක මුදලක් වැයවෙතැයි සිතිය නොහැකි බව දැන්වීය.

උක්ත ප්‍රදර්ශනය සඳහා සහභාගීවන ලෙස දැන් වු ලිපිය අනුව ඒ සඳහා සහභාගීවීමට ප්‍රමාණවත් කාලයක් නොතිබුණු බැවින්, පැරණි ආකෘතියම පළපුරුදු අයෙකු ලවා ඉතා නවීන සහ දර්ශණීය ආකාරයට සකස් කල බවත් මෙම ආකෘතිය හා එම ප්‍රදර්ශනකුටිය සවිකිරීමේ කාර්යය ද මෙම අය මගින් සිදුකරවා ගැනීමටද කටයුතු කරන බැවින්, මේ සඳහා ඉහත ස!දහන් කර ඇති මුදල වැයවන බවත්, මෙම මුදලට වඩා අඩු මුදලකින් නියමිත නිර්ණායකයන්ට අනුව මෙය නිර්මාණය කරදීමට ගරු මන්ත්‍රීවරුන්ට හැකියාව තිබේ නම් ඒ සඳහා අවස්ථාව සලසා දෙන බව ගරු සභාපතිතුමා විසින් පැවසීය.

මේ පිළිබඳව තව දුරටත් සාකච්ඡා කිරීමෙන් අනතුරුව මෙම කාර්යය කඩිනමින් කලයුතු කාර්යයක් සේ සලකා මේ සඳහාකැඳවා තිබු මිල ගණන් අතුරින් වජිර සංජීව විජේකෝන් මහතාගේ මිල ගණන පිළිගෙන අදාල කාර්යය ඉටුකරගැනීමට සභාවේ ආවරණ අනුමැතිය ලබාදෙන ලදී.

## 05:28 **ගුවන් පාලම කෙළවර පඩිපෙළ ආවරණය**

ඉහත ස!දහන් කාරණයට අදාළව බළන්ගොඩ, බස්නැවතුම්පල ීසරණම ව්‍යාපාරික සංසදයේ ලේකම් විසින් එවා ඇති 2008.07.28 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

ගුවන් පාලම කෙළවර පහල මාලයට බසින පඩිපෙළ ආවරණය මේ වනවිට ඉවත් කර ඇති බැවින්, මෙම කාලය තුළ උඩු මහලේ ව්‍යාපාර විශාල පසුබෑමකට ලක්ව ඇති නිසා, එම ආවරණ ක්‍රමවත් අයුරින් සකස් කර නැවත ස්ථාපිත කිරීමට කටයුතු සලස්වන ලෙස එමගින් ඉල්ලා ඇති බව ලේකම් මහතා සභාව වෙත දන්වන ලදී.

මගීන් මෙය සවිකිරීම තුළින් රාත්‍රී කාලයේ ද අපහසුතාවකට මුහුණදීමට සිදුවන බැවින්,ඉවත් කර තැබීම සුදුසු බව අනුමත කරන ලදී.

## 05:29 **සෞඛ්‍ය අංශයේ සේවයට නොපැමිණි සෞඛ්‍ය කම්කරු හා රියදුරන් පිළිබඳ නාම ලේඛණය**

මෙම වර්ෂයේ ජනවාරි මස සෞඛ්‍ය අංශයේ සේවයට නොපැමිණි කම්කරුවන් හා රියදුරන් පිළිබඳ විස්තරයක් සභාවට ඉදිරිපත් කර ඇති බව ලේකම් මහතා සභාව වෙත දන්වන ලදී.

මෙම වාර්තාව සලකා බැලීමේ දී ආර්.කේ. වික්‍රමසේන මහතා ජනවාරි මස දින 13 ක් සේවයට පැමිණ නැති බවත්, සෞඛ්‍ය අංශයේ සේවකයින් සේවයට නොපැමිණීමෙන් දෛනිකව ඉටුකළ යුතු වු මහජන සේවාවන් අඩාල වන අතර, සභාව දෝෂ දර්ශනයකට ද ලක්වන බවත්, විධිමත් පරිදි නිවාඩු ලබාගන්නා ලෙස නිරන්තරව මෙම සේවකයින් දැනුවත් කර තිබෙන නමුත්, ඔවුන් එම උපදෙස් පිළිනොගන්නා බව දක්නට නොමැති බවත්, එම නිසා වැඩිපුර නිවාඩු ප්‍රමාණයක් ලබාගෙන ඇති ආර්.කේ. වික්‍රමසේන මහතා සේවය අතහැර ගියා සේ සලකා කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දැන්වීය. සේවකයෙකුට තම සේවය අහිමිවීම දැඩි පීඩාවක් ගෙන දෙන කාරණයක් වන බවත්, එම නිසා, මේ පිළිඳව නැවත සලකා බලා, එම අයට සේවය සතුටුදායක කරගන්නා ලෙස දැණුම්දීමක් කරන ලෙස ගරු නගර සභා මන්ත්‍රි ඊ.ඒ. ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ඉල්ලා සිටින ලදී. මේ පිළිබඳව සලකා බැලු සභාව, ගරු මන්ත්‍රීතුමාගේ ඉල්ලීම පරිදි නැවත අවවාද කර මාසයක් කල්දීමටත්, ඉන් පසුව සේවය අසතුටුදායක නම් විනයානුකුල ක්‍රියාමාර්ගයක් ගැනීම සුදුසු බවටත් තීරණය කරන ලදී.

05:30 **ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් හිඟ මුදල් ලබාගැනීම**

2001 වර්ෂයේ ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවලදී නිව් හැපි ස්ටෝර්ස් ආයතනය වෙතින්, බළන්ගොඩ මෙම නගර සභාවට සපයන ලද ද්‍රව්‍ය වෙනුවෙන් නිකුත් කරන ලද බිල්පත් වල මුල් පිටපත් අස්ථානගවීම නිසා හිඟ මුදල් ලබාගැනීමට මෙතෙක් නොහැකි වී ඇති බව එහි කළමනාකරු විසින් එම ලිපියෙන් අවධාරණය කර ඇති බව ලේකම් මහතා වෙත දන්වන ලදී.

මේ සම්බන්ධව මෙම අය මීට පෙර පැවැති සභාවර කිහිපයකටම කරුණු ඉදිරිපත් කර ඇති බවත්, පළාත් පාලන කොමසාරිස් වෙත ද මේ පිළිබඳව දැනුම් දී ඇති නමුත්, මුදල් ගෙවීම සඳහා නිසි උපදෙසක් නොලැබුණු බවත්, තමා සභාපතිව සිටි අවධියේ මෙම ද්‍රව්‍ය ලබාගත් බවත්, තමාගේ ධුර කාලය අවසන්වීම නිසා, මුදල් ගෙවීමට නොහැකි වු බවත්, එවකට පත් වු සභාව විසින් අදාල මුදල් ගෙවීමට කටයුතු කර නොමැති බව ගරු සභාපතිතුමා විසින් දැන්වීය. ඇණවුම් කල භාණ්ඩ සභාව වෙත ලැබී ඇති බවට බිල්පත් තිබේ නම්, අදාල මුදල් ගෙවන ලෙස එවකට සිටි සභාපති වශයෙන් තමා විෂය භාර නිලධාරී වෙත උපදෙස් ලබාදුන් බව ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.විමලසේන මැතිතුමා විසින් පැවසීය.

මේ පිළිබඳව සාකච්ජා කල සභාව, මෙම ද්‍රව්‍ය වෙනුවෙන් මුදල් ගෙවා නොමැති බවත්, යම් හෙයකින් මුදල් ගෙවා ඇති බව අනාවරණය වුවහොත්, අදාල මුදල ගෙවීමට එම අය එකඟකරවාගැනීමේ කොන්දේසියට යටත්ව අදාල මුදල ගෙවීම සුදුසු බවට සභාව තීරණය කරන ලදී.

05:31 **බළන්ගොඩ බස්නැවතුම්පල උඩු මහලේ ඩී.44 දරණ කඩ කාමරය**

බළන්ගොඩ බස්නැවතුම්පලේ උඩුමහලේ අංක: ඩී.44 දරණ කඩ කාමරය පවත්වාගෙන යාම අපහසු බැවින්, ඒ සඳහා තැන්පත් කල මුදල් ඔහු නමින් ඇති සී.46 හා බී.20 දරණ කඩ කාමර කුලී සඳහා හිලව් කරගන්නා ලෙස ඉල්ලමින් මොහොමඩ් ජස්මී යන අය විසින් එවා ඇති 2008.12.30 දිනැති ලිපිය සභාගත කරන ලදුව, මෙවැනි කඩ කාමර සියල්ල සභාව වෙත භාරගෙන විධිමත් පරිදි නැවත ටෙන්ඩර් කිරීමට සභාව තීරණය කරන ලදී.

05:32 **කාබන් වෙළඳාමට ප්‍රවිශ්ඨ වීම**

ලෝක දේශගුණ විපර්යාස වෙනස්වීම් සම්බන්ධව ඇතිකර ගත් තියෝකෝ සම්මුතියට ශ්‍රී ලංකාව එළෙඹ ඇති බැවින්, ගෝලීය උණුසුම අඩුකිරීමේ උපායමාර්ගයක් ලෙස කාබන් ඩයොක්සයිඩ් සහ මීතේන් වායුව පරිසරයට මුදාහැරීම අඩුකිරීම මගින් ඉතිරි කරනු ලබන කාබන් ජාත්‍යන්තර කාබන් වෙළඳපොළේ අලෙවි කිරීමට හැකිවන පරිදි, ඊට සුදුසු සමාගමක් නගර සභාවට අනුබද්ධව පිහිටුවීම සුදුසු බව යෝජනා කරමින් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

දැනට නගර සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය මගින් මීතේන් වායුව දල වශයෙන් ටොන් 04 ජනනය අඩු කරන අතර, එය කාබන් ඩයොක්සයිඩ් ටොන් 80 කට ආසන්න බැව් පැහැදිලි කරන ලදී. මෙම සමාගම මගින් කාබන් වෙළඳාමට අමතරව කාබනික අලෙවි කිරීම ද කළ හැකි බැවින්, සමාගම් රෙජිස්ට්‍රාර් මගින් මේ සඳහා සභාවට අනුබද්දද සමාගමක් ලියාපදිංචි කර ඉදිරි කටයුතු කිරීමට සභාව අනුමත කරන ලදී. මේ සඳහා පොදු අරමුදලේ මුදල් යෙදවීමට ද සභාව අනුමත කරන ලදී.

ප.ව.12.30 ට පමණ සභාවේ කටයුතු තාවකාලික කල් තබන ලද අතර, ප.ව.2.00 ට පමණ නැවත සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

06. **<u>මුදල් ගෙවීම් අනුමත කිරීම (10000/- ට වැඩි ගෙවීම්)</u>**

2008.12.30 සිට 2009.01.26 දින දක්වා ගෙවන ලද රු.10000/- ට වැඩි ගෙවීම් පිළිබඳ විස්තරයක් සභාවට ඉදිරිපත් කර තිබුණි.

| | | | |
|---|---|---|---|
| 01. | කළමනාකරු ජල සම්පාදන මණ්ඩලය<br>2008 දෙසැම්බර් මාසයේ ජල බිල<br>පොදු වෙළදසල/පිංතාලිය | රු. | 12730.50 |
| 02. | ජාන් කොම්පියුටර්ස් සර්විස්<br>නව තොරතුරු මධ්‍යස්ථානයේ පරිඝනක ජාලයක්<br>ස්ථාපිත කිරීම. | රු | 12624.20 |
| 03. | ඩබ්.එස්. පැකේජින්<br>කාර්යාලය සඳහා අවශ්‍ය කදඩර චිටැ' 4 බැඑඑර<br>ඤා ග'4 බැඑඑර ඤා සපයා ගැනීම | රු. | 28660.50 |
| 04. | සාමාන්‍යාධිකාරි ඉඹුල්පෙ විවිධ සේවා<br>2008.12.01 සිට 2008.12.15 දක්වා ඉන්ධන බිල | රු. | 145884.40 |
| 05. | රිචඩ් ප්‍රැන්සිස්<br>බැංකියවත්ත ව්‍යාපෘතිය සඳහා වැලි කියුබ් 18 සැපයීම | රු. | 61575.00 |
| 06. | සාමාන්‍යාධිකාරි - ඉඹුල්පේ විවිධ සේවා<br>බැංකියවත්ත ව්‍යාපෘතිය සඳහා සිමෙන්ති මිටි 100 සැපයීම | රු. | 78500.00 |
| 07. | ඩැක්ස් ඉංජිනියරින් කොම්පැණි<br>බොබ් කැට් යන්ත්‍රය සඳහා සොලිඩ් ටයර් 04<br>(රිම් 04 සමග) මිළදී ගැනීම. | රු. | 639952.00 |
| 08. | ඉන්දික කොමියුනිකේෂන්<br>විදුලි සම්බන්ධතාව ලබාදීමේ ලිපි 1000<br>වරිපනම් බදු ගෙවීම ජ 2009- 2500<br>2009 වර්ෂයේ ව්‍යාපාර ලියාපදිංචි ලිපි 1000<br>දෛනික ලැයිස්තු - 5000<br>ව්‍යාපාර හා කර්මාන්ත ලිපි - 1500 | රු. | 15162.50 |
| 09. | සරණි පික්චර් පැලස්<br>ගලි අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ පද්ධතිය ඉදිකිරීම<br>වෙනුවෙන් අවශ්‍ය භාණ්ඩ ලබාගැනීම | රු. | 36748.80 |
| 10. | එල්.ටී.සී.සී. මෙටල් ක්‍රෂර්<br>බැංකියවත්ත ස!දහා ගල් ලබා ගැනීම | රු. | 93741.50 |
| 11. | එල්.ටී.සී.සී. මෙටල් ක්‍රෂර්<br>බැංකියවත්ත සඳහා 1 1/2 ගල් කියුබ් 01<br>1/2 ගල් කියුබ් 02<br>3/4 ගල් කියුබ් 07<br>6෦9 ගල් කියුබ් 09 | රු. | 61715.70 |
| 12. | එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම<br>කැලි කසල එකතු කිරීම හා ප්‍රවාහනය කිරීම<br>පිළිබඳ දැන්වීමක් පළකිරීම. | රු. | 12937.50 |

13. එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම
2009 වර්ෂයේ බළුන්ගොඩ බස්නැවතුම්පල
පිරිසිදු කිරීමේ හා නඩත්තු කිරීම පිළිබඳ දිනමිණ
පත්‍රයේ දැන්වීම. රු. 10350.00

14. කැළණි ඒජන්සීස්
ජල බවුසර දෙකේ මෝටර් අලුත්වැඩියාව හා
ස්ටෑන්ඩ් එක අලුත්වැඩියා කිරීම. රු. 55447.50

15. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්
ර!දවා ගැනීමේ බදු මුදල් ප්‍රේෂණය කිරීම
2008 නොවැම්බර් රු. 35045.98

16. පළාත් ආදායම් කොමසාරිස්
1% රඳවා ගැනීමේ බදු මුදල් යැවීම
2008 නොවැම්බර් රු. 12576.71

17. බී. ගුණරත්න මහතා
2008.12.16 සිට 2008.12.31 දින දක්වා නගරයේ
කැලි කසල එකතු කිරීම හා ප්‍රවාහනය කිරීම
ස!දහා කම්කරුවන් යෙදවීම. රු. 86500.00

18. සමෘද්ධි බැංකු සංගමය
කොටුගොඩැල්ල සිට දෙහිපිටිය ඇල්ල දක්වා
මාර්ගය කොන්ක්‍රීට් කිරීම අවසන් ගෙවීම. රු. 272221.63

18. සභාපති, තුඹගොඩ ගොවි සංවිධානය
ඉපිටපැත්ත අස්සැද්දුම පාර බැංකියවත්තට සම්බන්ධ පාර
කපා බෝක්කු දමා සංවර්ධනය කිරීම කර්මාන්තයේ අවසන්
ගෙවීම රු. 131938.20

19. සභාපති, තුඹගොඩ ගොවි සංවිධානය
වෙට්ටතෝල් පාර ජල ටැංකිය පාර 1 පටුමග
කොන්ක්‍රීට් කිරීම කර්මාන්තයේ අවසන් ගෙවීම. රු. 9 0753.55

20. සභාපති, තුඹගොඩ ගොවි සංවිධානය
ස!දුන්ගම පාර අවසන් කොටස ෂඞ අදියර කොන්ක්‍රීට්
කිරීම කර්මාන්තයේ 10% රැඳවුම් ගෙවීම. රු. 17633.00

21. සාමාන්‍යාධිකාරී, ඉඹුල්පේ විවිධ සේවා
ගලි අපද්‍රව්‍ය පිරිසිදු කිරීමේ පද්ධතිය ඉදිකිරීම
වෙනුවෙන් සිමෙන්ති මිටි 150 මිළදී ගැනීම. රු. 117750.00

22. කැළණි ඒජන්සීස්
227-5020 ගලි බවුසරයට 2 1/2 ග්‍රේ හෝස්
අඩි 20 ක් මිළදී ගැනීම රු. 10000.00

| | | | |
|---|---|---|---|
| 23. | එම්.ජී. පියසේන<br>පෞද්ගලික බස් ගාල් ගාස්තු වලින් තැන්පත්<br>ආපසු ගෙවීම. | රු. | 21750.00 |
| 24. | ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ්<br>විදුණැත පියසේ 2008 නොවැම්බර් හා දෙසැම්බර්<br>මාසවල දුරකථන බිල්පත් පියවීම සඳහා මුදල් ගෙවීම<br>හිඟ මුදල සමග | රු. | 23454.20 |
| 25. | සභාපති, තුඹගොඩ ගොවි සංවිධානය<br>පල්ලෙවෙල ලිඳ අසල අතුරු මාර්ගයේ අඩි 100<br>කොන්ක්‍රීට් කිරීම හා එපිටපැත්ත දෙසට ඇති<br>මාර්ගයේ අඩි 100 ක් කොන්ක්‍රීට් කර සංවර්ධනය<br>කිරීම කර්මාන්තයේ 10% රැඳවුම් ගෙවීම. | රු. | 27228.43 |
| 26. | පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය<br>ගරු සභාපතිතුමා හා වැඩ අධිකාරී මහතාගේ<br>විදේශ සංචාරයේ මුළික ගෙවීම. | රු | 184520.00 |
| 27. | සිලෝන් පෙට්‍රෝලියම් කෝපරේෂන්<br>තාර බැරල් 35 මිළදී ගැනීම | රු. | 654850.00 |
| 28. | කළමනාකරු,ලංකා බැංකුව,බළන්ගොඩ<br>අත්තිකාරම් මුදල් පියවීම. | රු. | 5864230.84 |
| 29. | රිචඩ් ප්‍රැන්සීස්<br>වැලි කියුබ් 13 සැපයීම | රු. | 48262.50 |
| 30. | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>දුරකථන බිල පියවීම<br>2287023/2287022/2287024/060-2452931/<br>060-2452932 | රු. | 15502.63 |
| 31. | සමෘද්ධි බැංකු සංගමය දෙපැලමුල්ල<br>පහල කිරිමැටිතැන්න පුෂ්පා රංජනී මියගේ නිවස<br>අසල බෝක්කු 02 හා පැති බැම්ම ඉදිකිරීම<br>කර්මාන්තයේ අවසන් ගෙවීම. | රු. | 74948.69 |
| 32. | එල්.ඊ.සී.සී. මෙටල් ක්‍රෂර්<br>බැංකියවත්ත ස!දහා<br>6o9 ගල් කියුබ් 05<br>1/2 ගල් කියුබ් 03<br>ර ගල් කියුබ් 04<br>1 1/2 ගල් කියුබ් 01 | රු. | 44733.15 |
| 33. | සාමාන්‍යාධිකාරී, ඉඹුල්පේ විවිධ සේවා<br>බැංකියවත්ත සඳහා සිමෙන්ති මිටි 150<br>මිළදී ගැනීම | රු. | 120000.00 |

35. සාමාන්‍යාධිකාරී, ඉඹුල්පේ විවිධ සේවා
2008.12.15 සිට 2008.12.26 දක්වා ඉන්ධන බිල පියවීම රු. 78318.30

36. සාමාන්‍යාධිකාරී, ඉඹුල්පේ විවිධ සේවා
2008.12.15 සිට 2008.12.20 දක්වා ඉන්ධන බිල පියවීම රු. 58026.30

36. එච්. රංජිත් විමලසිරි
බළන්ගොඩ බස්නැවතුම්පලේ සිට බැංකියවත්ත වැඩබිම
දක්වා පස් කියුබ් 33 ප්‍රවාහනය කිරීම. රු. 19800.00

37. ඉන්දික කොමිනිකේෂන්
ඉරිදා පොළ රිසිට් පොත් 100
මුද්‍රණය කරවා ගැනිම. රු. 15500.00

38. මහජන බැංකුව, ආදීපාද වීදිය
2008 ජුනි, ජුලි, අගෝස්තු මාස මලට අදාල
බිල්පත් සදහා ගෙවීම. රු. 85287.21

39. සභාපති, කිරිදිගල ග්‍රාම සංවර්ධන සමිතිය
තුඹගොඩ කෝපිවත්ත රණවිලාවත්ත මාර්ගය
කොන්ක්‍රීට් කිරීම කර්මාන්තයේ 20% ප්‍රජාදායකත්වය අඩුකල
මුදල 10% රැදවුම් ආපසු ගෙවීම. රු. 94354.88

40. ඉඹුල්පේ විවිධ සේවා සමිතිය
බැංකියවත්ත සදහා සිමෙන්ති මිටි 200 මිළදී ගැනීම රු. 157000.00

41. රිචඩ් ප්‍රැන්සිස්
බැංකියවත්තට වැලි කියුබ් 17 ක් ලබාගැනීම. රු. 57487.50

42. වජිර සංජීව විජේකෝන්
දැයට කිරුළ ප්‍රදර්ශනය සදහා ප්‍රදර්ශණ කුටි ඉදිකිරීම
ස!දහා අත්තිකාරම් මුදල් ගෙවීම. රු. 50000.00

43. ඉන්දික එරික් සිසිල්
ජී.කේ.6224 ට්‍රැක්ටරය බළන්ගොඩ සිට ගම්පහ දක්වාත්
මුතුරාජවෙල සිට බළන්ගොඩ දක්වා තාර බැරල් 35
ප්‍රවාහනය කිරීම. රු. 16000.00

44. සෙනුර සිවිල් ඉංජිනියරින්
බැංකියවත්ත ව්‍යාපෘතියේ ගොඩනැගිල්ල ඉදිකිරීම හා පොළව
කොන්ක්‍රීට් කිරීම අදියර කර්මාන්තයේ අවසන් කොටස
60% ගෙවීම. රු. 3028545.34

45. කළමනාකරු ජල සම්පාදන මණ්ඩලය
2008 දෙසැම්බර් මස ජල බිල පියවීම රු. 36453.00

46. ලංකා විදුලි බල මණ්ඩලය.
2008 දෙසැම්බර් මස විදුලි බිල පියවීම රු. 72587.40

47. දේශීය ආදායම් කොමසාරිස්(වැට් )
දේශීය ආදායම් කොමසාරිස්ගේ වැට් 1/3 ගෙවීම රු. 142873.89

48. දේශීය ආදායම් කොමසාරිස් රඳවා ගැනීමේ බදු රු. 28574.17

49. සෙනුර සිවිල් ඉංජිනියරින්
බැංකියවත්ත ව්‍යාපෘතියේ ගොඩනැගිල්ල ඉදිකිරීම හා පොළොව
කොන්ක්‍රීට් කිරීම කර්මාන්තයේ අවසන් ගෙවීම. රු. 2014388.67

50. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වැට් බදු 1/3 රු. 96531.59

51. දේශීය ආදායම් කොමසාරිස්
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් රඳවා ගැනීමේ බදු 1% රු. 19306.33

මෙම මුදල් ගෙවීම් සියල්ල අනුමත කිරීමට තීරණය කල සභාව, මින් ඉදිරියට ඉදිරිපත් කරනු ලබන මුදල් ගෙවීම් වාර්තාව සියල්ලම පරීක්‍ෂණක ගත කර සභාවට පෙර ගරු මන්ත්‍රීවරුන් වෙත ලැබීමට සලස්වන ලෙස විෂය භාර නිලධාරිණිය වෙත දැනුම් දීමට තීරණය කරන ලදී.

## 07. **ඇස්තමේන්තු අනුමත කිරීම:**

07:01 බැංකියවත්ත ගොඩනැගිලි වල තීන්ත ආලේප කිරීම. රු. 262082.82

07:02 බැංකියවත්ත අලුතින් ඉදිකල හට් 03 හි පිටුපස අළුත් කාණුව
දැමීම, සමරු ඵලකය ඉදිරිපිට කොටස බ්ලොක් ගල් බැම්ම බැ!දීම
අළුත් කාණුව මැද ටැංකිය බැඳීම,පොළොව කොන්ක්‍රීට් කිරීම
( පළමු හට් එක පිටුපස ) රු. 382433.27

07:03 බැංකියවත්ත දෙමහල් ගොඩනැගිල්ල විවේක කාමරය
ලෙස අළුතින් ඉදිකිරීම. රු. 48310.82

07:04 නව බස්නැවතුම්පල අසල නව කියවීම් ශාලාව සහිත
ඉඩම ඉවුරු කපා එම පස් බැංකියවත්ත වැඩබිමට
ප්‍රවාහනය කර ඉවත් කිරීම. රු. 103086.90

07:05 බළන්ගොඩ නව බස්නැවතුම්පල විවෘත ප්‍රදේශ තුන
( පොදු වැසි කුඩු 3 ) අසල සහ ගුවන් පාලම අසල
දෙපස කොටස බිල්ට්ඕඩ් කණු කොන්ක්‍රීට් කිරීම රු. 39195.92

07:06 බුලත්ගම සුසාන භූමිය මායිම් තාප්පය තීන්ත ආලේප
කිරීම. රු. 361253.37

07:07 නගරය අලංකාර වන අයුරින් තොරතුරු මධ්‍යස්ථානය
අසල ඉඩම් කොටස බැම් බැඳ දැල ගැසීම,පොලීසිය
ඉදිරිපිට කොටස කම්බි කණු සිටුවා කම්බි යෙදීම සහ
ගේට්ටුව, දොර ( ඇලුමිනියම් ) යෙදීම රු. 839313.99

07:08 මලාපවහන පද්ධතිය ඉදිකිරීම කර්මාන්තය ටැංකිය
කපරාරු කිරීම. රු. 131859.33

07:09 ගලී ප්‍රතිකාරක පද්ධතිය ඉදිකිරීම ස්ථානයේ අමතර
අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම. රු. 856018.99

07:10 බස්නැවතුම්පල ප්‍රධාන ගොඩනැගිල්ල ඉදිරිපස
වැසිදිය වැලකීම සඳහා අමානෝ පියස්ස ඉදිකිරීම රු. 278607.00

ඉහත ඇස්තමේන්තු අනුමත කල අතර, ඉතා කඩිනමින් කල යුතු තිබු කර්මාන්තයන් සඳහා සභාවේ ආවරණ අනුමැතිය ලබාදීමට ද තීරණය කරන ලදී.

08.1 **<u>යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ</u>**

11. **<u>යථා පරිදි කල් දී ඇති යෝජනා:</u>**

09. **<u>ටෙන්ඩර් හා මිළ ගණන් සලකා බැලීම</u>**:

09:01 බළන්ගොඩ නගර සභාවේ කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා පොහොර හලනයන්ත්‍රයක් මිළදී ගැනීම හා මළ අපද්‍රව්‍ය පිරිසිදු කිරීමේ පද්ධතිය සඳහා කදජදබමළ ඡසඉැර කෙදි ලබාගැනීම සඳහා කැඳවන ලද ලංසුපත් විවෘත කිරීම මෙම අවස්ථාවේ දී සිදුකරන ලදී.

පොහොර හලන යන්ත්‍රය සඳහා ලැබී ඇති මිළ ගණන් පහත දැක්වේ.

| ආයතනය | මිළ ගණන |
|---|---|
| ඇට්ලස් මෙටල් වර්ක්ස් | රු.895000/- |
| කැළණි ඒජන්සීස් | රු.1500000/- |

මෙම මිළ ගණන් සලකා බැලු සභාව, අවම මිළ ගණන ඉදිරිපත් කර ඇති අට්ලස් මෙටල් වර්ක්ස් ආයතනයේ මිළ ගණන පිළිගැනීමට තීරණය කරන ලදී.

මළ අපද්‍රව්‍ය පිරිසිදු කිරීමේ පද්ධතිය සඳහා කදජදබමළ ඡසඉැර කෙදි ලබාගැනීම සඳහා Thurul S.A.F.E .Environment ආයතනයේ පමණක් මිළ ගණන් ලැබී ඇති බැවින්, එම ආයතනයෙන් ලැබී ඇති රු. 1272700/- ක් වු මිළ ගණන පිළිගැනීමට සභාව තීරණය කරන ලදී.

09:01 2009 වර්ෂය සඳහා බළන්ගොඩ නගර සභාවේ ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය ගල් හා වැලි මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් සභාවට ඉදිරිපත් කරන ලදී.
අදාල මිළ ගණන් පහත දැක්වේ.

| ගල් වර්ගය | එල්.ටී.සී.මෙටල් ක්‍රෂර් | එස්.ඩී.සී.සී.ආයතනය | එම්.ටී.කේ.විජයසිරි |
|---|---|---|---|
| 2..o 2.. ගල් | 4100/- | - | 4200/- |
| 4..o 4.. ගල් | 4000/- | - | 4300/- |
| 6..o 9.. ගල් | 2300/- | - | 2430/- |
| 1 1රැ2.. ගල් | 4400/- | 4700/- | 4550/- |
| අගල | 4600/- | 4900/- | 4750/- |
| 3/4 ගල් | 4800/- | 5000/- | 4950/- |
| 1/2 ගල් | 3300/- | 3600/- | 3500/- |
| කුඩු | 2500/- | 3000/- | 2750/- |
| 'ඊක | 4700/- | 5000/- | 4900/- |

මෙම මිල ගණන් අතුරින් අවම මිළ ගණන ඉදිරිපත් කර ඇති එල්.ටී.සී.මෙටල් ක්‍රෂර් ආයතනයෙන් මිල ගණන පිළිගැනීමට සභාව තීරණය කරන ලදී.

| වැලි කියුබ් ප්‍රමාණය | රිචඩ් ප්‍රැන්සිස් | සුගත් කල්තොට | නව්ටන් රජවක | එච්.බී. ගුණරත්න |
|---|---|---|---|---|
| 2009 වසර සඳහා වැලි සැපයීම ( වැලි කියුබ් 01 සඳහා | රු.3750/- | රු.4100/- | රු.4300/- | රු.3750/- |

මෙම මිළ ගණන් සලකා බැලු සභාව රිචඩ් ප්‍රැන්සිස් හා එච්.බී.ගුණරත්න යන විසින් අවම මිළ ගණන ඉදිරිපත් කර ඇති බැවින්, එම දෙදෙනාගෙන්ම 2009 වසර සඳහා වැලි මිළදී ගැනීම සුදුසු බවට සභාව තීරණය කරන ලදී.

09:03 මෙම නගර සභාවේ රාජකාරී කටයුතු සඳහා දැනට භාවිතා කරන ෆැක්ස් යන්ත්‍රය හා සේවකයින්ගේ පැමිණීමේ වේලාව සටහන් කිරීම සඳහා භාවිතා කරනු ලබන වේලාසටහන් යන්ත්‍රය නිරන්තව අළුත්වැඩියා කිරීමට සිදුවන බව ලේකම් මහතා විසින් සභාව වෙත දන්වන ලදුව, මිළ ගණන් කැඳවා අලුතින් ෆැක්ස් යන්ත්‍රයක් හා ඇඟිලි සලකුණු යන්ත්‍රයක් මිළදී ගැනීම සුදුසු බවට සභාව තීරණය කරන ලදී.

09:04 **අංක:56-1906 කඝ කැබ් රථයට ස්ටියරිං පද්ධතියක් සවිකර ගැනීම**

ඉහත අංක දරණ වාහනයට ස්ටියරිං පද්ධතියක් සවිකර ගැනීමට කැඳවන ලද මිළ ගණන් කැඳවන ලදී. අදාල මිළ ගණන් පහත දක්වා පහත දක්වා.( අමතර කොටස් මිළදී ගැනීම සඳහා )

| අමතර කොටස | පී.පී.එන්ටර් ප්‍රයිසස්,කුරුණෑගල | චමින්ද මෝටර්ස් ,බළන්ගොඩ | නෑණතල් මෝටර්වේස් ,බළන්ගොඩ |
|---|---|---|---|
| 1. එස්.ටී.බොක්ස්/පී.පම්ප් බ්‍රැකට් පීආර් හෝස්/ඔයිල් කෑන්/එස්ටී/ග්‍රෝ ඒජස්ටර් පුලර් | **රු.29500/-** | රු.33000/- | රු.38000/- |
| 2. එෆ්ආර්/බෆර් | **රු.9000/-** | රු.11200/- | රු.15000/- |
| සවිකිරීම් ගාස්තු | ආනන්ද ඔටෝ මෝටර්ස්,කුරුණෑගල<br><br>**රු.8500/-** | චමින්ද මෝටර්ස් බළන්ගොඩ<br><br>රු.9400/- | නෑණතල් මෝටර්වේස්,බලන්ගොඩ<br><br>රු.10000/- |

අවම මිළ ගණන ඉදිරිපත් කර ඇති ආයතනයෙන් අවශ්‍ය අමතර කොටස් මිළදී ගෙන සවිකිරීම සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

09:04 **<u>අංක: 227-5020 දරණ ගලී බවුසරය සඳහා සංඥා ලාම්පු පද්ධතියක් ලබාගැනීම:</u>**

ඉහත අංක දරණ වාහනයේ හදිසි අවස්ථාවක දී ( නගරයේ හදිසියේ ඇති වන ගින්නක් නිවීම වැනි කාර්යයක් සඳහා ) දැල්වීම සඳහා විදුලි ලාම්පු පද්ධතියක් ලබාදෙන ලෙස ඉල්ලමින් එම වාහනයේ රියදුරු මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

| වර්ගය | කැළණි ඒජන්සීස්,බලන්ගොඩ | එච්.එල්.ඩබ්.ඉංජිනියරින් බලන්ගොඩ | යුනිකෝඩ් ඔටෝ පාට්ස්,කරුණෑගල |
|---|---|---|---|
| සයිරන් විදුලි ලාම්පු හා නලා පද්ධතිය | රු.24000/- | රු.24750/- | රු.23000/- |

මෙම මිළ ගණන අතුරින් රු.23000/- ක් වූ අවම මිළ ගණන පිළිගැනීමට සභාව තීරණය කරන ලදී.

10. **<u>යෝජනා</u>**

ගරු සභාපති,ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමා විසින් පහත සඳහන් යෝජනාවන් ඉදිරිපත් කරන ලදී.

01. නගර සභාව සතු කසළ කැබ් රථය සහ ටිපර් රථය අළුත්වැඩියා කර වෙන්දේසි කිරීම සඳහා සභා තීරණයක් ගැනීම.

මෙම වාහන වෙන්දේසි නොකර මිළ ගණන් කැඳවා පිළිගත් ගරාජයකින් මෙම වාහන 02 අළුත්වැඩියා කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

02. නගර සභා පෙර පාසල් ක්‍රීඩාපිටියේ සවිකර ඇති ක්‍රීඩා උපකරණ ගලවා අලුත් උපකරණ සවිකිරීම. සීසෝ හැර ඉතිරි ක්‍රීඩා උපකරණ අළුත්වැඩියා කිරීම සුදුසු බවට සභාව තීරණය කරන ලදී.

03. විදුණැන තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය ඉදිරිපිට බස්නැවතුම්පලට මුහුණ ලා සභා අරමුදලින් අළුතින් කඩ කාමර ඉදිකිරීම හා එම තොරතුරු මධ්‍යස්ථානයේ ආරක්ෂාව සඳහා සභා අරමුදලින් ආරක්ෂිත වැටක් ඉදිකිරීම.
මෙම යෝජනාව සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

04. කිරිදිගල මැද පාර , වැවේගෙදර පාර, සරස්වතීවත්ත කනත්තට යන පාර අළුත්වැඩියා කිරීම.
මෙම මාර්ග සංවර්ධනය සඳහා ඇස්තමේන්තු සකස් කිරීමටත්, මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මහා මාර්ග සංවර්ධන අමාත්‍යාංශයෙන් ලබාගැනීමටත්, මුදල් ලබාගැනීමට නොහැකි වුවහොත්, සභා අරමුදල් යොදා අදාල සංවර්ධන කාර්යයන් ඉටුකිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05. 2009.02.01 වන දින භාරගැනීමට නියමිත බළන්ගොඩ තානායම සම්පූර්ණයෙන්ම අලුත්වැඩියා කිරීම.
දැනට මෙම තානායම පවත්වාගෙන යන අය ඉතා හොඳින් මෙය පවත්වාගෙන යන බැවින්,එම අයටම නැවත මෙය පවත්වාගෙය යාම සඳහා අවසර ලබාදීම සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් ඉල්ලා සිටින ලද අතර, එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. මේ සම්බන්ධව තවදුරටත් සාකච්ඡා කිරීමෙන් අනතුරුව, මෙය භාරගැනීමෙන් පසුව එය පවත්වාගෙන යාම පිළිබඳව පළාත් පාලන කොමසාරිස්ගෙන් උපදෙස් ලබාගැනීමට තීරණය කරන ලදී.

06. බදු නොගෙවා ඇති නව බස්නැවතුම්පලෙහි කඩ කාමර ආපසු භාරගැනීම.
මෙම කඩ කාමර සියල්ල භාරගෙන නැවත ටෙන්ඩර් කිරීමට තීරණය කරන ලදී.

07. නව බස්නැවතුම්පලෙහි ප්‍රධාන ගොඩනැගිල්ල ඉදිරිපස වැසිදිය වැලකීම සඳහා ආවරණ පියස්සක් සැකසීම හා ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කිරීම සදහා සභා අනුමැතිය ලබාගැනීම.
බස්නැවතුම්පල ගොඩනැගිල්ල ඉදිරිපස වැසිදිය ආවරණ පියස්සක් ඉදිකිරීම සඳහා විශල මුදලක් වැයවන බවත්, අනවශ්‍ය වියදම් අවම කරගැනීමට කටයුතු කරන ලෙස ගරු නගර සභා මන්ත්‍රි,ඩබ්.ඒ. වසන්ත පුෂ්පකුමාර, ඊ.ඒ. ජයන්ත ප්‍රේමකුමාර, යන ගරු මන්ත්‍රීතුමන්ලා විසින් ඉල්ලා සිටි අතර, බස්නැවතුම්පල ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කිරීම සඳහා ද විශාල වියදමක් දැරීමට සිදුවන බවත් එම නිසා එම යෝජනා ක්‍රියාත්මක නොකරන ලෙස ඉල්ලා සිටින ලදී.

10.08. සෞඛ්‍ය අංශය සඳහා බුෂ් කටර් යන්ත්‍රයක් හා කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා ගිනි නිවීමේ උපකරණයක් මිළදී ගැනීම සුදුසු බවට ද සභාව තීරණය කරන ලදී.

10:09 **පොළ ඉදිකිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම විධායක ඉංජිනේරු ඩබ්.එම්.ජයවික්‍රම මහතා වෙත පැවරීම.**

බළන්ගොඩ මහජන පොළෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇති බැවින්, එහි ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය කිරීම ඩබ්.එම්.ජයවික්‍රම මහතා වෙත පවරා ඇති බැවින් , ඒ සඳහා සභාවේ ආවරණ අනුමැතිය ලබාදෙන ලදී.

11. **<u>කාරක සභා වල වාර්තා සලකා බැලීම</u>**:

- 2008.12.01 සිට 2008.12.31 දක්වා මෙම සභාව සතු වාහන සඳහා වැය වු ඉන්ධන පිළිබඳ වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන ලදුව, සභාව විසින් එය සම්මත කරන ලදී.

- 2009.01.09 වන දින පැවැති කර්මාන්ත කමිටු රැස්වීමෙහි වාර්තාව සභාව ඉදිරිපත් කරන ලදුව, නව බස්නැවතුම්පල ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කිරීම හැර අනෙකුත් යෝජනා සියල්ල සභාව විසින් අනුමත කරන ලදී. ( බස්නැවතුම්පල ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කිරීම සඳහා අනුග්‍රාහක ආයතනයක දායකත්වය ලබාගැනීම සඳහා පුවත්පත් දැන්වීමක් පළකිරීමට තීරණය කරනලදී.)
- 2009.01.15 වන දින පවත්වන ලද සෞඛ්‍ය කමිටු රැස්වීමේ වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදුව, එම වාර්තාව සභාව විසින් අනුමත කරන ලදී.
- කමිටු වාර්තා සභා රැස්වීම පැවැත්වීමට සතියකට පෙරවත් ලබාදෙන ලෙස ගරු නගර සභා මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් ඉල්ලා සිටින ලදී.

12. **<u>ආදායම් වියදම් හා අනෙකුත් වාර්තා ඉදිරිපත්කිරීම:</u>**

12:01 2008 දෙසැම්බර් මාසයට අදාල ආදායම් හා වියදම් වාර්තාව ඉදිරිපත් කර තිබුණි.

| | |
|---|---|
| පුනරාවර්තන ආදායම් | රු.3077769.27 |
| වෙනත් ලැබීම් | රු.1425260.18 |
| | ------------------ |
| මුළු ලැබීම් | රු.4503029.45 |
| | |
| පුනරාවර්ථන වියදම් | රු.3536911.20 |
| වෙනත් ගෙවීම් | රු. 702509.92 |
| | ----------------- |
| මුළු ගෙවීම් | රු.4239421.12 |

මෙම ආදායම් හා වියදම් වාර්තාව සභාව විසින් ඒකමතිකව අනුමත කරන ලදී.

13. **වෙනත් කරුණු :**

13:01 **ගරු නාගරික මන්ත්‍රී , ධර්මසේන සමරසිංහ මැතිතුමා**

ගරු මන්ත්‍රීතුමා කථා කරමින් අතිගරු ජනාධිපතිතුමාගේ වැඩ පිළිවෙල ඉදිරියට ගෙන යාම සඳහා එතුමාගේ දෑත් ශක්තිමත් කිරීම සඳහා මධ්‍යම පළාත් සභාව ජයග්‍රහනය කරවීම වෙනුවෙන් තමා පසුගිය දිනවල නුවර ප්‍රදේශයේ මැතිවරණ ප්‍රචාරක කටයුතු වලට සහභාගී වූ බවත්, මෙම මැතිවරණයෙන් එක්සත් ජනතා නිදහස් සංධානයට විශිෂ්ඨ ජයක් ලැබෙන බවත් අද දින සභා රැස්වීම පැවැත්වෙන බැවින්, ඊට සහභාගීවීම ඉතා වැදගත් වන නිසා, ඒ සඳහා සහභාගීවීමට පැමිණි බවත් දැන්වීය. අද දින සභාවේ වැඩ කටයුතු වාද විවාද තර්ක විතර්ක මධ්‍යයේ ඉතා සාර්ථකව ඉටු කිරීමට හැකි වූ බවත් මෙම සභාවේ ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා/චෝදනා/අදහස් වලට සාවදාන ඇහුම්කන් දීම, ආවේගශීලීත්වයෙන් තොරව, පිළිතුරුදීම ගරු සභාපතිතුමාගේ යුතුකම හා වගකීම බව අවධාරණය කල එතුමා මින් ඉදිරියට ඒ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර කටයුතු කරන ලෙස එතුමාගෙන් ඉල්ලා සිටින බව දැන්වීය.

මහජනතාවගේ ප්‍රයෝජනය උදෙසා නගරය තුළ ඉදිකර ඇති වැසිකිලි, කැසිකිලි ප්‍රමාණය ප්‍රමාණවත් නොවන නිසා, ප්‍රමාණවත් වැසිකිලි, කැසිකිලි ප්‍රමාණයක් ඉදිකරන ලෙස ඉල්ලා සිටින ලදී.

13:02 **ගරු නාගරික මන්ත්‍රී, ටී.ඒ. ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා:**

ගරු මන්ත්‍රීතුමා කථා කරමින්, බළන්ගොඩ - බණ්ඩාරවෙල මාර්ගය ඉතා අලංකාර ලෙස ප්‍රතිසංස්කරණය කර පදික වේදිකා යොදා ඇති අතර, ඔරලෝසු කණුව, බලගහමුල, බස්නැවතුම්පල යන ප්‍රදේශයන්හි පමණක් මාර්ග දෙපස ආරක්ෂිත අත්වැටවල් යෙදීමට කටයුතු කර ඇති බවත්, නමුත් තුඹගොඩ ප්‍රදේශයේ එම අත්වැටවල් යෙදීමට කටයුතු කර නොමැති බවත්, මෙම ප්‍රදේශයේ ප්‍රධාන පෙළේ පාසල් දෙකක් තිබෙන බැවින්, පාසල් දරුවන්ගේ ආරක්ෂාව උදෙසා ආරක්ෂිත අත්වැටවල් යෙදීම අත්‍යාවශ්‍ය බැවින්, මේ කෙරෙහි මාර්ග සංවර්ධන අධිකාරියේ අවධානය යොමුකරවීමට කටයුතු කරනලෙස ඉල්ලා සිටින ලදී.

බලන්ගොඩ වෙටිනෝල් පාර අබලන් වී ඇති බැවින්, එය සකස් කරදෙන ලෙස ඉල්ලා සිටි ගරු මන්ත්‍රීතුමා, බළන්ගොඩ නගරයේ ක්‍රමවත් ආකාරයට රථවාහන ධාවනය කරවීම සම්බන්ධව මෙම නගර සභාව, බළන්ගොඩ පොලිස් ස්ථානය, මාර්ගස්ථ මගී ප්‍රවාහනය අධිකාරිය, ලංකා ගමනා ගමන මණ්ඩලය එක්ව රථවාහන ධාවන සැලසුමක් සකස් කල බවත්, එම සැලසුම අනුව රථවාහනය ධාවනය වීමක් සිදුනොවන බව දැන්වීය. එම නිසා මේ පිළිබඳ බළන්ගොඩ පොලිස් ස්ථානය දැනුවත් කිරීමට ක්‍රියාකරන ලෙස ඉල්ලා සිටින ලදී.

බළන්ගොඩ නගරයේ විථි පහන් නඩත්තුව අක්‍රමවත් බවත්, විදුලි කණුවල 75% බල්බ් නොමැති බවත්, විදුලි කාර්මික මහතා මෙම සභාව සතුව තිබෙන ත්‍රීරෝද රථයේ සේවය සඳහා යොදා තිබෙන නිසා, නිසි පරිදි එම කාර්යය සිදුනොවන බවත්, යටත් පිරිසෙයින් එම මහතා විථි පහන් නඩත්තුව සඳහා සෙනසුරාදා හා ඉරිදා යන දින දෙකෙහි හෝ අදාල රාජකාරියෙහි යෙදවීමට ක්‍රියාකරන ලෙස ඉල්ලීමක් කරන ලදී. 2009 වර්ෂය සඳහා වැසිකිලි ආධාර/විශ්ව විද්‍යාල ශිෂ්‍යත්ව/නිවාස ආධාර සඳහා මුදල් වෙන්කර ඇති බැවින්, එම ආධාර ලබාදීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමින් සිය කථාව අවසන් කරන ලදී.

13:04 **ගරු නාගරික මන්ත්‍රී , ඩබ්.ඒ. වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා**

ගරු මන්ත්‍රීතුමා කථාකරමින්, තමා 1991 වර්ෂයේ සිට මේ දක්වා මෙම නගර සභාවේ නාගරික මන්ත්‍රීවරයෙකු ලෙස සේවය කරන බවත්, මෙම කාලය තුළ සභාවේ කටයුතු සාර්ථක කරගැනීම සඳහා උපරිම සහයෝගයක්ම ලබා දුන් බවත් ඇතැම් අවස්ථාවල දී ගරු සභාපතිතුමා විසින් ගනු ලබන තීරණ වලට අනුමැතිය ලබාදීම හිතට විරුද්ධ වුවද , සාමූහික හැඟීමෙන් කණ්ඩායමක් ලෙස සහෝදරත්වයෙන් කටයුතු කිරීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගෙන අවශ්‍ය අනුමැතිය ලබාදුන් බව දැන්වීය.

මෙම සභාවට ගරු සභාපතිතුමා/උපසභාපතිතුමා/මන්ත්‍රීතුමන්ලා පත්කර ඇත්තේ මහජනතාව බවත්, එම ජනතාව අප කෙරෙහි විශාල විශ්වාසයක් තබා ඇති අතර, ඔවුන් අප වෙත ඉදිරිපත් කරනු ලබන යෝජනා/ඉල්ලීම්/ගැටළු ආදිය සම්බන්ධව කරුණු ඉදිරිපත් කිරීම, අදහස් විමසීම ගරු මන්ත්‍රීවරයෙකු සතු යුතුකම හා වගකීම වන බව දැන්වීය. නමුත්, මෑතක සිට ගරු සභාපතිතුමා, ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස්/ප්‍රකාශ හෑල්ලුවකට ලක් කරමින් ඉතා අවේගශීලීව කටයුතු කරන බවක් දක්නට ලැබෙන දැන්වීය. ගරු මන්ත්‍රීවරයෙකුට සිය අයිතීන් අනුව කටයුතු කිරීමට අවස්ථාව තිබිය යුතු බවත්, යම් යම් කාරණා සම්බන්ධව අසනු ලබන ප්‍රශ්ණ වලට ගරු සභාපතිතුමාගේ අවසරය මත අවශ්‍ය කරුණු පැහැදිලි කරදීම ලේකම්වරයාගේ ද වගකීම වන බව දැන්වීය.

අද දින පවත්වනු ලැබූ මෙම සභාවේ න්‍යාය පත්‍රයට යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ යන තීරය සඳහා තමා විසින් ලිඛිතව ප්‍රශ්න දෙකක් යොමු කල බවත්, න්‍යාය පත්‍රයට එය ඇතුළත් කර ඇතත්, එය සභාවට ඉදිරිපත් කිරීමක් නොකල බව කණගාටුවෙන් යුතුව දන්වා සිටින බව පැවසීය.

බුලත්ගම දෙමළ විද්‍යාල පාර පැච්කර දෙන ලෙස ඉල්ල සිටි ගරු මන්ත්‍රීතුමා, විදේශ සංචාර වලට සහභාගීවීමට ගරු මන්ත්‍රීවරුන්ට ද අවස්ථාව සලසා දෙන ලෙසත්, ඒ සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදන සභාපති අරමුදලින් දරන ලෙසත් ඉල්ලා සිටින ලදී.

බළන්ගොඩ ප්‍රදේශයේ තරුණ තරුණියන්ගේ ක්‍රීඩා කෞශල්‍ය ඔප් නැංවීමට සභාවේ දායකත්වය ලබාදිය යුතු බවත්, එම නිසා, බළන්ගොඩ ආසනය තුළ ක්‍රිකට් තරඟාවලියක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලෙස ඉල්ලා සිටින ලදී. ක්‍රීඩා භූමි කම්කරුගේ රාජකාරී වේලාව පෙ.ව.8.30 - 5.30 ලෙස සංශෝධනය කරන ලෙසත් , මෙම නගර සභාවේ රැස්වීම් ශාලාව වායු සමීකරණය කිරීමට පියවර ගන්නා ලෙෂත් ඉල්ලා සිටිමින් සිය කථාව අවසන් කරන ලදී.

13:03 **ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්. රූමි මැතිතුමා:**

ගරු මන්ත්‍රීතුමා කථා කරමින්, කුමාරගම 1 පටුමග හා මුස්තාපා මාවත සංවර්ධනය කරදෙන ලෙස ඉල්ලා සිටින ලදී. කුමාරගම හංදියට වෙනත් ප්‍රදේශවල අය කුණු ගෙනවිත් දමන බැවින්, ඒ සම්බන්ධව සොයා බලන ලෙස ඉල්ලා සිටිමින් සිය කථාව අවසන් කරන ලදී.

13:04 **ගරු නගර සභා මන්ත්‍රී,ඩබ්.විමලසේන මැතිතුමා:**

ගරු මන්ත්‍රීතුමා කථා කරමින්, නව බස්නැවතුම්පල හා කාණු පද්ධතිය සඳහා විශාල ණය මුදලක් ගෙවීමට තිබෙන නිසා, වියදම් සීමා කර සභාවේ ආදායම් තත්ත්වය වැඩිදියුණු කරගත යුතු බවත්, දැනට ඉදිකෙරෙන නව පොලෙහි කඩ කාමර ඉහලම මිලකට බදු ලබාදන්නේ නම්, වැඩි ආදායමක් ලබාගත හැකි බව දැන්වීය. නගරයේ විථි පහන් නඩත්තුව ඉතාමත් අක්‍රමවත් බවත්, මේ සම්බන්ධව ජනතාව දෝෂාරෝපණය කරනු ලබන බවත්, එබැවින්, ඒ කෙරෙහි අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිමින් සිය කථාව අවසන් කරන ලදී.

14. **අවසානය:**

**<u>ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා:</u>**

අද දින සභාවේ කටයුතු සාර්ථක කරගැනීම සඳහා සහයෝගය ලබාදුන් ගරු මන්ත්‍රීවරුන් සියළු දෙනාටත්, ලේකම් මහතාටත් සිය ස්තුතිය පුදකරමින් ලැබුවාවූ 2009 නව වසර සැමට සාමය ,සතුට පිරි සෞභාග්‍යමත් නවසරක් වේවා යි ප්‍රාර්ථනය කල අතර, ප.ව.04.00 ට පමණ රැස්වීමේ වැඩ කටයුතු අවසන් කරන ලදී.

ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.